# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## පුරප්පාඩු

*"ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයේ කොටස්කරුවකු වීමට එක්වන්න"*

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පුරප්පාඩු වී පවත්නා **ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි (01) හා සංවර්ධන නිලධාරි (02)** තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. තනතුරට පැවරෙන ප්‍රධාන කාර්යයන් හා වගකීම්**

**ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි**

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් තීරණය කරනු ලබන්නා වූ ද, අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වූ ද, අධ්‍යාපන පර්යේෂණ/සමීක්ෂණ සැලසුම් කිරීම, මෙහෙයවීම හා ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම සඳහා මූලිකත්වය ගැනීම.
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවලියේ දී සභාපති, උපසභාපතිවරු සහ ලේකම් යන නිලධාරීන්ට සහය වීම.
- ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරීන්ගේ/අදාළ වැඩසටහන් නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණය.

**සංවර්ධන නිලධාරි**

- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් ඉටු කරනු ලබන පර්යේෂණ/සමීක්ෂණ ආදී ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනයට, විවරණයට හා සංශෝධනයට අදාළ කටයුතු සඳහා සහය වීම.
- ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සම්පාදනය කෙරෙන ලේඛන සඳහා අවශ්‍ය තොරතුරු හා දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණාත්මක වාර්තා සකස් කිරීම.

**02. පොදු සුදුසුකම්**

(i) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(ii) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.

(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට,

ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරි - වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය.

සංවර්ධන නිලධාරි (ප්‍රතිපත්ති/සැලසුම්/තොරතුරු) - වයස අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

(රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**03. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි**

මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය.

**04. එක් එක් තනතුරට අදාල තොරතුරු**

| | |
|---|---|
| 4.1 තනතුරු නාමය<br>4.1.1 වැටුප් පරිමාණය<br>4.1.2 සුදුසුකම් හා පළපුරුද්ද | **<u>ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී</u>**-(AR 2 )<br>රු.59,540 – 10 x 1,570-75,240 (වසර 2018)<br>රු.76,200 – 10 x 2,000-96,200 (වසර 2020)<br>**බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)**<br>1 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය හෝ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශේෂවේදී උපාධියක්<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.<br>2 සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය හෝ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD)<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහ (05) ක පර්යේෂණ පළපුරුද්දක් ලබා තිබීම.<br><br>අභ්‍යන්තර අයදුම්කරුවන් **(පහත සඳහන් 1 හෝ 2 හෝ 3)**<br><br>1 බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.<br>2 සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය හෝ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී/සාමාන්‍ය උපාධියක්<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම<br>සහ<br>"අධ්‍යයන/පර්යේෂණ" සේවා ශ්‍රේණියේ (AR1) තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම<br><br>3 සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යාව, ගණිතය, ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, තොරතුරු තාක්ෂණය හෝ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශේෂවේදී/සාමාන්‍ය උපාධියක් විෂය ක්ෂේත්‍රයට අදාළව<br>සමග<br>අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් (PhD) ලබා තිබීම<br>සහ<br>"අධ්‍යයන/පර්යේෂණ" සේවා ශ්‍රේණියේ (AR1) තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. |

| | |
|---|---|
| 4.2 තනතුරු නාමය<br>4.2.1 වැටුප් පරිමාණය<br>4.2.2 සුදුසුකම් හා පළපුරුද්ද | <u>සංවර්ධන නිලධාරී</u> - (MA 4)<br>රු. 30,074 - 15 X 599 - 39,059 (වසර 2018)<br>රු. 37,970 - 10 X 755 - 15 X 930 – 5 X 1,135 - 65,145 (වසර 2020)<br>**බාහිර අයදුම්කරුවන්** (පහත සුදුසුකම් 1 හෝ 2)<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපනය, කළමනාකරණය, විද්‍යාව, තොරතුරු තාක්ෂණවේදය, පරිගණක විද්‍යාව, ගණිතය, පුස්තකාල විද්‍යාව, සංඛ්‍යානය, ආර්ථික විද්‍යාව, තාක්ෂණවේදය හෝ සමාජ විද්‍යාව යන විෂයය ක්ෂේත්‍රයන්ගෙන්)<br>2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයකින් අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත්වීම.<br>**අභ්‍යන්තර අයදුම්කරුවන්** ( පහත 1 හෝ 2 )<br>1. බාහිර අයදුම්කරුවන් සඳහා වන ඉහත සඳහන් සුදුසුකම් සපුරා තිබීම.<br>2. " කළමනාකාර සහකාර - තාක්ෂණික නොවන " (MA 1) සේවා ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අට (08) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම. |

**05. තෝරාගැනීමේ ක්‍රමවේදය**

සුදුසුකම් හා පලපුරුද්ද අනුව අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කර සම්මුඛ පරීක්ෂණයක් හා/හෝ ලිඛිත විභාගයක් සඳහා කැඳවනු ලැබේ.

සියලුම අයදුම්පත්, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්බන්ධ සහතිකවල පිටපත් සමග **2018.11.12** දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත අදාළ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
නො.126, නාවල පාර,
නුගේගොඩ

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
## ආදර්ශ අයදුම් පත්‍රය

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ..................................................................................**

**තනතුර සඳහා අයදුම් පත්‍රය**

(1) 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම:..........................................................................................

1.2 මුලකුරු සමග නම:..........................................................................................................

(2) ස්ථිර ලිපිනය:........................................................................................................................

(3) දුරකතන අංකය : ......................................................

(4) ජාතික හැඳුනුම්පත් අංකය:.......................................

(5) 5.1 උපන් දිනය: වර්ෂය ................. මාසය ................ දිනය ..................

5.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස: වර්ෂ.............. මාස ............ දින ..............

(6) ස්ත්‍රී/පුරුෂ භාවය:...............................

(7) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :..............................

(8) අධ්‍යාපන සුදුසුකම්

8.1 ප්‍රථම උපාධියේ විස්තර

උපාධියේ නම: ....................................................................................................

උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය: .........................................................................

උපාධිය බාහිර/අභ්‍යන්තර ද යන වග: ..............................................................

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | විෂයයන් | පන්ති සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

8.2 පශ්චාත් උපාධි හෝ වෙනත් උපාධි පාඨමාලා පිළිබඳ විස්තර

උපාධියේ නම: ....................................................................................................

උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය: .........................................................................

පන්ති සාමාර්ථය: ...............................................................

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | ප්‍රධාන විෂයයන් | පර්යේෂණ උපාධියක් ද යන වග | පර්යේෂණ නිබන්ධනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(9) වෙනත් සුදුසුකම්:

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(10) වෘත්තීය සුදුසුකම්:

| | සුදුසුකම | ආයතනය | කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(11) පර්යේෂණ හා ප්‍රකාශන ඇත්නම්:

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

(12) සේවා පළපුරුද්ද (අධ්‍යාපන හා පර්යේෂණ)

| | තනතුර | ආයතනය | කාලය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(13) මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

.......................................  .................................................

දිනය  අයදුම්කරුගේ අත්සන

(14) රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ .......................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.............................................  ..............................................................

දිනය  අත්සන හා නිල මුද්‍රාව